(අටවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක 1.]

# පාර්ලිමේන්තුවේ
# න්‍යාය පුස්තකය

**2018 මැයි 22 වැනි අඟහරුවාදා ඇතුළුව එදින සිට**

**නිකුත් කළේ 2018 මැයි 11 වැනි සිකුරාදා**

---

**2018 මැයි 22 වැනි අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ වාර්ෂික මත්පැන් බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 දෙසැම්බර් 11 දිනැති අංක 2049/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.20 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 1004 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

* 2.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 75 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 75 දරන නියමය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මම, 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 4,300,000,000 සිට රු. 4,315,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |

| | | |
|---|---|---|
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2017.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018.04.26 වැනි දින,
කොළඹ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 76 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 76 දරන නියමය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මම, 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 22302 "ගබඩා අත්තිකාරම් ගිණුම (පුපුරණ ද්‍රව්‍ය) - ශ්‍රී ලංකා නාවික හමුදාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | <u>අයිතමය</u> | <u>සංශෝධනය</u> | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 450,000,000<br>රු. 575,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 460,000,000<br>රු. 595,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 360,000,000<br>රු. 380,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2017.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018.04.26 වැනි දින,
කොළඹ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3),— 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 77 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 77 දරන නියමය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මම, 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 24702 "අත්අඩංගුවට ගන්නා ලද සහ රාජසන්තක කරන ලද භාණ්ඩ පිළිබඳ අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා රේගුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 6,000,000<br>රු. 14,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,000,000<br>රු. 3,800,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 35,000,000<br>රු. 39,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2017.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018.04.26 වැනි දින,
කොළඹ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4),— 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 78 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

# 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 78 දරන නියමය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මම, 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 30602 "ගබඩා අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,800,000,000 සිට රු. 1,400,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2017.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018.04.26 වැනි දින,
කොළඹ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5),— 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 79 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

# 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 79 දරන නියමය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මම, 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 31002 "ගබඩා අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 120,000,000 සිට රු. 160,000,000 දක්වා |

| | | | |
|---|---|---|---|
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 120,000,000<br>රු. 140,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 40,000,000<br>රු. 65,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 20,000,000<br>රු. 40,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2017.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018.04.26 වැනි දින,
කොළඹ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6),— 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 80 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 80 දරන නියමය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මම, 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 31003 "කළවැඩ අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 330,000,000<br>රු. 400,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2017.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018.04.26 වැනි දින,
කොළඹ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 7),— 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාට පැවරුන බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

(මෙම නියමයන් වලංගු වන්නේ 2017.12.31 වැනි දින දක්වා පමණි.)

## උපලේඛනය
## 2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධානය

2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2017 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛනය.

### කණ්ඩායම් විධාන අංක 01

2016 අංක 24 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව මට පැවරී ඇති බලතලවලට අනුව මංගල සමරවීර වන මම, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා වශයෙන් රජයේ අනුමතිය අනුව මේ සමඟ දක්වා ඇති උපලේඛනයේ දැක්වෙන ආකාරයට රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්වල විෂය අංක 00101, 00201, 01001, 02001, 02101, 10201, 10301, 10401, 11101, 11201, 11701, 12101, 13001, 13501, 13601, 14501, 14701, 14901, 15001, 15301, 15401, 15501, 16301, 19301, 19401, 19501, 19601, 19701, 19801, 20101, 20701, 21101, 21501, 22201, 22301, 22401, 22501, 22601, 23201, 23901, 24701, 24801, 24901, 25101, 25301, 25401, 25501, 25601, 25701, 25901,26001, 26101, 26201, 26301, 27001, 27101, 27401, 27701, 27801, 28001, 28401, 28701, 28801, 28901, 29201, 29601, 30101, 30601, 30801, 30901, 31001, 32001, 32201 සහ 33101ට අදාළ වන්නා වූ පනතේ තෙවැනි උපලේඛනය තීරු අංක II සහ IV හි දක්වා ඇති උපරිම සීමාවන් සහ අංක III හි දක්වා ඇති අවම සීමාවන් සංශෝධනය කරමි.

| අනු අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විෂය අංකය | II රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | III රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | IV රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට රු. | දක්වා රු. | සිට රු. | දක්වා රු. | සිට රු. | දක්වා රු. | |
| 1 | අතිගරු ජනාධිපති | 00101 | 32,000,000 | 45,000,000 | | | | | 1 |
| 2 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 00201 | 16,000,000 | 20,000,000 | | | 45,000,000 | 47,000,000 | 2 |
| 3 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිෂන් සභාව | 01001 | | | 5,000,000 | 4,000,000 | | | 3 |
| 4 | මැතිවරණ කොමිෂන් සභාව | 02001 | 24,000,000 | 38,000,000 | 16,000,000 | 18,000,000 | 80,000,000 | 85,000,000 | 4 |
| 5 | විගණකාධිපති | 02101 | | | 55,000,000 | 52,000,000 | 253,000,000 | 228,000,000 | 5 |
| 6 | මුදල් අමාත්‍යවරයා | 10201 | 15,000,000 | 19,000,000 | 9,500,000 | 10,000,000 | | | 6 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 7 | ආරක්ෂක අමාත්‍යවරයා | **10301** | **75,000,000** | **85,000,000** | **55,000,000** | **45,000,000** | | | 7 |
| 8 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා | **10401** | | | **16,000,000** | **12,000,000** | | | 8 |
| 9 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා | **11101** | | | **1,200,000,000** | **1,070,000,000** | | | 9 |
| 10 | විදේශ කටයුතු අමාත්‍යවරයා | **11201** | **30,000,000** | **35,000,000** | **24,000,000** | **28,000,000** | | | 10 |
| 11 | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා | **11701** | **19,000,000** | **21,200,000** | | | | | 11 |
| 12 | ස්වදේශ කටයුතු අමාත්‍යවරයා | **12101** | **580,000,000** | **650,000,000** | **265,900,000** | **230,000,000** | | | 12 |
| 13 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යවරයා | **13001** | | | **30,000,000** | **26,000,000** | | | 13 |
| 14 | වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා | **13501** | | | **12,000,000** | **9,000,000** | | | 14 |
| 15 | ක්‍රීඩා අමාත්‍යවරයා | **13601** | **11,000,000** | **12,300,000** | | | | | 15 |
| 16 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ පුනරුත්ථාපන, නැවත පදිංචිකිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍යවරයා | **14501** | | | **5,500,000** | **4,000,000** | | | 16 |
| 17 | ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යවරයා | **14701** | **2,000,000** | **6,000,000** | **600,000** | **700,000** | **7,000,000** | **9,000,000** | 17 |
| 18 | කර්මාන්ත හා වාණිජ අමාත්‍යවරයා | **14901** | **21,000,000** | **27,000,000** | | | **65,000,000** | **75,000,000** | 18 |
| 19 | ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යවරයා | **15001** | **5,000,000** | **6,000,000** | **2,500,000** | **2,300,000** | | | 19 |
| 20 | ඉඩම් අමාත්‍යවරයා | **15301** | | | | | **30,000,000** | **43,216,000** | 20 |
| 21 | ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා | **15401** | **20,000,000** | **25,000,000** | | | | | 21 |
| 22 | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා | **15501** | **12,000,000** | **14,500,000** | | | | | 22 |
| 23 | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා | **16301** | **38,000,000** | **40,500,000** | | | | | 23. |
| 24 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා | **19301** | | | **4,500,000** | **3,900,000** | | | 24. |
| 25 | විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යවරයා | **19401** | **2,800,000** | **4,000,000** | **1,100,000** | **1,300,000** | **6,300,000** | **7,800,000** | 25. |
| 26 | සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා | **19501** | | | **4,000,000** | **3,400,000** | | | 26. |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 27 | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යවරයා | 19601 | 23,000,000 | 29,000,000 | | | | | 27 |
| 28 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යවරයා | 19701 | | | 12,000,000 | 10,000,000 | | | 28 |
| 29 | වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යවරයා | 19801 | | | 13,000,000 | 7,000,000 | | | 29 |
| 30 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 20101 | 29,000,000 | 34,000,000 | 18,000,000 | 18,500,000 | | | 30 |
| 31 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | 20701 | | | 35,000,000 | 30,000,000 | | | 31 |
| 32 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 21101 | 70,000,000 | 80,000,000 | 50,000,000 | 53,000,000 | | | 32 |
| 33 | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 21501 | | | 55,000,000 | 49,000,000 | | | 33 |
| 34 | ශ්‍රී ලංකා යුධ හමුදාව | 22201 | | | 2,828,000,000 | 2,540,000,000 | | | 34 |
| 35 | ශ්‍රී ලංකා නාවික හමුදාව | 22301 | 625,000,000 | 550,000,000 | 570,000,000 | 500,000,000 | | | 35 |
| 36 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 22401 | | | 490,000,000 | 418,000,000 | | | 36 |
| 37 | පොලිස් දෙපාර්තමේන්තුව | 22501 | | | 1,450,000,000 | 1,248,000,000 | | | 37 |
| 38 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | 22601 | 35,000,000 | 39,000,000 | | | 140,000,000 | 143,000,000 | 38 |
| 39 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 23201 | | | 140,000,000 | 135,000,000 | | | 39 |
| 40 | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | 23901 | 6,000,000 | 7,000,000 | | | | | 40 |
| 41 | ශ්‍රී ලංකා රේගුව | 24701 | 45,000,000 | 50,000,000 | | | | | 41 |
| 42 | සුරාබදු දෙපාර්තමේන්තුව | 24801 | 42,000,000 | 45,000,000 | 32,000,000 | 34,000,000 | | | 42 |
| 43 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 24901 | 7,000,000 | 8,000,000 | 3,700,000 | 4,200,000 | | | 43 |
| 44 | තක්සේරු දෙපාර්තමේන්තුව | 25101 | | | 19,000,000 | 17,000,000 | | | 44 |
| 45 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 25301 | 45,000,000 | 53,000,000 | | | | | 45 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 46 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 25401 | 62,000,000 | 80,000,000 | | | | | 46 |
| 47 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ | 25501 | 58,000,000 | 68,200,000 | 43,000,000 | 37,000,000 | | | 47 |
| 48 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ | 25601 | | | 80,000,000 | 64,000,000 | 246,000,000 | 280,000,000 | 48 |
| 49 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කළුතර | 25701 | 87,000,000 | 122,000,000 | | | | | 49 |
| 50 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ | 25901 | | | 38,000,000 | 32,000,000 | | | 50 |
| 51 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - නුවර එළිය | 26001 | 32,000,000 | 32,004,000 | | | | | 51 |
| 52 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල | 26101 | 65,000,000 | 86,000,000 | 55,000,000 | 57,000,000 | 230,000,000 | 235,000,000 | 52 |
| 53 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර | 26201 | 62,000,000 | 109,000,000 | 55,000,000 | 57,000,000 | | | 53 |
| 54 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට | 26301 | | | 51,000,000 | 41,000,000 | | | 54 |
| 55 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර | 27001 | | | 49,000,000 | 48,000,000 | | | 55 |
| 56 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - ත්‍රිකුණාමලය | 27101 | | | 23,000,000 | 22,500,000 | | | 56 |
| 57 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර | 27401 | | | 50,000,000 | 49,000,000 | | | 57 |
| 58 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොණරාගල | 27701 | | | 35,000,000 | 32,000,000 | | | 58 |
| 59 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර | 27801 | 64,000,000 | 110,000,000 | | | 220,000,000 | 245,000,000 | 59 |
| 60 | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | 28001 | 5,000,000 | 6,000,000 | 4,000,000 | 3,200,000 | | | 60 |
| 61 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 28401 | 55,000,000 | 65,000,000 | 42,000,000 | 38,000,000 | 163,000,000 | 168,000,000 | 61 |
| 62 | ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | 28701 | 19,000,000 | 24,000,000 | | | | | 62 |
| 63 | මිනින්දෝරු දෙපාර්තමේන්තුව | 28801 | 148,000,000 | 166,000,000 | | | | | 63 |
| 64 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 28901 | | | 29,000,000 | 28,000,000 | 110,000,000 | 105,000,000 | 64 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 65 | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | **29201** | **29,000,000** | **32,000,000** | | | | | 65 |
| 66 | ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව | **29601** | **5,000,000** | **5,050,000** | | | | | 66 |
| 67 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්) | **30101** | | | **3,000,000** | **2,700,000** | | | 67 |
| 68 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | **30601** | **750,000,000** | **830,000,000** | | | | | 68 |
| 69 | තැපැල් දෙපාර්තමේන්තුව | **30801** | **820,000,000** | **880,000,000** | | | | | 69 |
| 70 | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | **30901** | | | **18,000,000** | **13,500,000** | | | 70 |
| 71 | රජයේ කර්මාන්ත ශාලාව | **31001** | **32,000,000** | **38,000,000** | **23,000,000** | **26,000,000** | | | 71 |
| 72 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | **32001** | **781,500,000** | **500,000,000** | **325,000,000** | **300,000,000** | | | 72 |
| 73 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | **32201** | **25,000,000** | **29,000,000** | **17,000,000** | **17,500,000** | **82,000,000** | **83,000,000** | 73 |
| 74 | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව | **33101** | | | **300,000,000** | **265,000,000** | | | 74 |

අත්සන් කළේ මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018.04.26
කොළඹ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියමය (අංක 1),— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 ව්‍යවස්ථාවේ (2) ඡේදය සමඟ කියවිය යුතු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 24ඇ සහ 24ඈ වගන්ති යටතේ වරතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 19 දිනැති අංක 2024/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.05.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියමය (අංක 2),— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වගන්තිය සමඟ කියවිය යුතු, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 ද වගන්තිය යටතේ පොලිතීන් භාවිතය කළමනාකරණය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 සැප්තැම්බර් 01 දිනැති අංක 2034/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.05.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියමය (අංක 3),— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වගන්තිය සමඟ කියවිය යුතු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 ද වගන්තිය යටතේ පොලිතීන් භාවිතය කළමනාකරණය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 සැප්තැම්බර් 01 දිනැති අංක 2034/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.05.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියමය (අංක 4),— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වගන්තිය සමඟ කියවිය යුතු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 ද වගන්තිය යටතේ පොලිතීන් භාවිතය කළමනාකරණය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 සැප්තැම්බර් 01 දිනැති අංක 2034/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.05.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියෝගය (අංක 5),— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වගන්තිය සහ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 32 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 23 එ සහ 23 ඒ වගන්ති යටතේ පොලිතීන් භාවිතය කළමනාකරණය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 සැප්තැම්බර් 01 දිනැති අංක 2034/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.05.09 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියමය (අංක 6),— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වගන්තිය සමඟ කියවිය යුතු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 ද වගන්තිය යටතේ පොලිතීන් භාවිතය කළමනාකරණය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 සැප්තැම්බර් 01 දිනැති අංක 2034/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.05.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියමය (අංක 7),— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වගන්තිය සමඟ කියවිය යුතු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 ද වගන්තිය යටතේ පොලිතීන් භාවිතය කළමනාකරණය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 සැප්තැම්බර් 01 දිනැති අංක 2034/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.05.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 1),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 (4) වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ජූනි 16 දිනැති අංක 1867/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය සංශෝධනය කරමින් 2017 දෙසැම්බර් 29 දිනැති අංක 2051/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 2),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 (4) වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මාර්තු 16 දිනැති අංක 2062/47 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත 2017 දෙසැම්බර් 15 දිනැති අංක 2049/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 දරන හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(3) වගන්තිය සහ 14 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වගන්තිය යටතේ 2017 ආනයන හා අපනයන පාලන (ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන) නියෝග සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මාර්තු 29 දිනැති අංක 2064/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.05.09 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 59 සහ 63 වගන්ති සමඟ කියවිය යුතු, 142(2) වගන්තියේ (ද) ඡේදය යටතේ 2017 අංක 2 දරන ඖෂධ ලියාපදිංචි කිරීම (ගාස්තු) නියෝග සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 05 දිනැති අංක 2052/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.04.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*20.

ජාතික විගණන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමූහිකරණය කිරීමේ පනත් කෙටුම්පත — කාරක සභාව.

*22.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

සුරැකුම්පත් විනිමය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*29.

අල්ලස් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*30.

ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*31.

කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*32.

සූතිකාධාර (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*33.

පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා,— පළාත් සභා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ කමිටු වාර්තාව,— 2017 අංක 17 දරන පනතින් සංශෝධිත 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 3අ. (11) වගන්තිය ප්‍රකාරව සීමා නිර්ණය කමිටුව විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදුව 2018.03.06 දින පාර්ලිමේන්තුවේදී සභාගත කරන ලද එකී කමිටුවේ වාර්තාව අනුමත කළ යුතු ය.

*34.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතියට යටත්ව 2015.11.27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එච්. එම්. ගාමිණී විජේසිංහ මහතා විගණකාධිපතිවරයා වශයෙන් පත්කර ඇති හෙයින්ද;

විගණකාධිපතිවරයාගේ වැටුප ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන හෙයින්ද;

ජනාධිපතිවරයා විසින් 2017.11.14 වැනි දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව 2017.12.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විගණකාධිපති, එච්. එම්. ගාමිණී විජේසිංහ මහතාට පහත පරිදි වැටුප් හා දීමනා ගෙවීමට අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) 2015.11.27 වැනි දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 අනුව SL - 4 වැටුප් පරිමාණයේ 08 වැනි වැටුප් පියවරේ පිහිටුවා වැටුප් ගෙවීම හා තනතුරට හිමි අනෙකුත් දීමනා ගෙවීමට;

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 අනුව 2016.01.01 වැනි දින සිට වැටුප පරිවර්තනය කිරීමේ දී SL – 4 වැටුප් ක්‍රමය යටතේ එම චක්‍රලේඛයේ උපදෙස් පරිදි වැටුප් පරිවර්තනය කර ගෙවීමට; සහ

(ඇ) එකී වැටුප් පරිමාණයට අදාළ වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමට.

ඊට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව, විගණකාධිපති, එච්. එම්. ගාමිණී විජේසිංහ මහතා වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීම කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

*35.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5) (අ) ව්‍යවස්ථාව ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් සාදන ලද, 2017 දෙසැම්බර් 04 දිනැති අංක 2048/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු, මාධ්‍ය උපමාන අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*36.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*37.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*38.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*39.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

40.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

41.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

42.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

43.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

44.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

45.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

46.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

47.

ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

48.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## 2018 ජූනි 08 වැනි සිකුරාදා

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

1.

පා. 1/'18

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය, — පාසල් ශිෂ්‍ය විනය කමිටු පරීක්ෂණ විධිමත් පරිදි සිදුකිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කිරීම,— ඇතැම් පාසල්වල ශිෂ්‍යයන්ගේ විනය ගැටලුවලදී විධිමත් විනය පරීක්ෂණ සිදු නොකොට ශිෂ්‍යයන් පාසලෙන් ඉවත් කිරීමට කටයුතු කරන අතර එමගින් එම ශිෂ්‍යයන්ගේ අධ්‍යාපන කටයුතු අඩාල වී විශාල අසාධාරණයකට ලක්වීමත්, බොහෝ දරුවන් දැඩි මානසික පීඩනයකට පත් වී, මානසික රෝගීන් වීමත්, ඇතැම් දරුවන් සමස්ත ගුරු ප්‍රජාවට මෙන්ම, සමාජයටම වෛර කරමින් සමාජ විරෝධී අපරාධකරුවන් වූ අවස්ථා ද දක්නට ඇති හෙයින්, පාසල් ශිෂ්‍යයන්ගේ විනය විරෝධී ක්‍රියාවලදී වඩාත් විධිමත් පරිදි හා අපක්ෂපාතී විනය පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කිරීම සඳහා උචිත වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

2.

පා. 2/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— බදුල්ල මහ රෝහල ශික්ෂණ රෝහලක් ලෙස භාවිතා කරමින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට අනුබද්ධව රජයේ වෛද්‍ය පීඨයක් ආරම්භ කිරීම,— අප රට තුළ ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වෛද්‍යවරුන් ප්‍රමාණයෙන් දැනට සිටින්නේ 50% ක් පමණ වන අතර අ.පො.ස. (උසස් පෙළ) ජීව විද්‍යා විෂය ධාරාවෙන් ඉහළම සාමාර්ථ ලබා ගන්නා ශිෂ්‍යකයන් රැසකට රජයේ වෛද්‍ය පීඨවලට ප්‍රවේශවීමේ අවස්ථාව අහිමි වී ඇති අතර රජයේ අධ්‍යාපන හා සෞඛ්‍ය සේවාවන් ශක්තිමත් කිරීම සඳහා බදුල්ල මහ රෝහල ශික්ෂණ රෝහලක් ලෙස භාවිතා කරමින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට අනුබද්ධව රජයේ වෛද්‍ය පීඨයක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

3.

පා. 3/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මොරටුව විශ්වවිද්‍යාලය සඳහා යෝජිත වෛද්‍ය පීඨය සඳහා ශික්ෂණ රෝහල ලෙස නාගොඩ මහ රෝහල සංවර්ධනය කිරීම,— 2018 අයවැය මඟින් මොරටුව විශ්වවිද්‍යාලයට අනුබද්ධව වෛද්‍ය පීඨයක් ඉදිකිරීමට යෝජනා කර ඇති අතර එම යෝජිත වෛද්‍ය පීඨය සඳහා ශික්ෂණ රෝහල ලෙස නාගොඩ මහ රෝහල සංවර්ධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

4.

පා. 4/'18

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම,— ශිෂ්ට සම්පන්න සමාජයකට නොගැලපෙන අයුරින් රට තුළ ව්‍යාප්ත වන අපචාර හා බාල අපරාධ මර්දනය කිරීම හා ස්වයං විනයක් ඇති කිරීම උදෙසා සියලුම දරුවන්ට, 9 ශ්‍රේණිය දක්වා ඔවුන්ගේ ආගමට අනුකූල දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

5.

පා. 5/'18

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතා නියෝජිතයින්ගේ ගරු නාම අත්හැරීම,— ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු පාර්ලිමේන්තු, පළාත් සභා, ප්‍රාදේශීය සභා නියෝජනය කරන සියලුම ජනතා නියෝජිතයන් මාසිකව තමන් කරන සේවයට අදාළව වැටුප් හා / හෝ දීමනා ලබා ගන්නා අතර ඉහත කිසිදු ධුරයක් නිස්සරණාධ්‍යාසයෙන් සිදු කරනු ලබන ගරු සේවයන් නොවන බැවින් ද, එම ධුර දරන්නන්ගේ නමට ඉදිරියෙන් හෝ ධුරයට ඉදිරියෙන් අතිගරු, ශ්‍රීමත් හෝ ගරු යන නාම සහ නමට පසුව උතුමාණන්, මැතිතුමා යන පද යෙදීම උපහාසයට ලක්වීමට හේතුවක් වී ඇති බැවින් ද, ජනතා නියෝජිතයන්ගේ ගරු නාම භාවිතය නතර කිරීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

6.

පා. 6/'18

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ 1988 සිට 2010 දක්වා වසර 22ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදි සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

7.

පා. 7/'18

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

**8.**

පා. 8/'18

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම ආරක්ෂා කර ගැනීම සඳහා වූ ජාතික වැඩ පිළිවෙළක් ආරම්භ කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම භාවිතා වන වෛද්‍ය ක්‍රම, කෘෂිකර්මාන්තය, ආහාර සංරක්ෂණය, හස්ත කර්මාන්ත අංශය ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි පාරම්පරික දැනුම ආරක්ෂා කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන් නියෝජනය කෙරෙන ජනතාවගෙන් තොරතුරු ලබාගෙන, ජෛව විවිධත්ව ඒකකය, බුද්ධිමය දේපළ කාර්යාංශය ඇතුළු අදාළ අංශ ඒකාබද්ධව ජාතික වැඩ පිළිවෙළක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

9.

පා. 9/'18

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,— බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ධර්ම ඥානය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උන්වහන්සේලාගේ කථන හැකියා, ශ්‍රවණ හැකියා, පරිගණක, මනෝවිද්‍යාත්මක සහ උපදේශනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන ආයතනවලට පරිබාහිරව මෙම කටයුතු සඳහාම වෙන් වූ භික්ෂු අධ්‍යාපන ආයතන ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

10.

පා. 10/'18

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම,— තිරිඟු පිටි සඳහා විදේශ රටවලට ඇදී යන විශාල ධනස්කන්ධය නවතාලීමේ අරමුණ ඇතිව ආදේශකයක් ලෙස භාවිතා කළ හැකි සහල් පිටිවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම සඳහාත්, කෙඳි සහිත ධාන්‍ය වර්ගයක් වන සහල් වඩාත් සියුම් ලෙස තිරිඟු පිටි මෙන් අඹරා ගැනීම සඳහාත්, තිරිඟු පිටි ඇඹරීමට භාවිතා කරන ආකාරයේ යන්ත්‍ර සූත්‍ර සහ නව තාක්ෂණය හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

11.

පා. 11/'18

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකීය/දේශීය සූපවේදය පිළිබඳ රට තුළ ජනතා ආකල්ප පුළුල් කිරීම,— ශ්‍රී ලාංකීය/දේශීය ආහාර කලාව පිළිබඳ දේශීය හා විදේශීය ජනතාව තුළ වැඩි නැඹුරුවක් ඇති කිරීමේ අරමුණ ඇතිව, රට තුළ ජනතා ආකල්ප ඒ වෙත යොමු කිරීම සඳහා පාසල්, විශ්වවිද්‍යාල, තෘතීයික අධ්‍යාපන ආයතනවල විෂය පාඨමාලාවට සූපවේදය විෂයයක් ලෙස ඇතුළත් කිරීමටත්, රාජ්‍ය හා පෞද්ගලික අංශවල මැදිහත්වීම මත පර්යේෂණ අංශ දිරිගැන්වීම මඟින් නව සොයාගැනීම් සිදු කිරීමටත්, ඒ හා බැඳුනු ආයතන පද්ධතිය සම්බන්ධ කර ගනිමින් සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි, පශ්චාත් උපාධි පාඨමාලා ඇති කිරීම තුළින් මෙම ක්ෂේත්‍රය පිළිබඳ ජනතාව තුළ පුළුල් ආකල්පමය වෙනසක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

12.

පා.12/'18

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් විෂය නිර්දේශයට මනෝ විද්‍යාව විෂයය ඇතුළත් කිරීම,— පාසල් ශිෂ්‍ය ප්‍රජාව නිරෝගී මනසකින් යුත් බුද්ධිමත් තීරණ ගැනීමට හැකි පිරිසක් ලෙස හැඩගැස්වීම උදෙසා හය වැනි ශ්‍රේණියේ සිට ක්‍රියාත්මක වන පරිදි බෞද්ධ මනෝ විද්‍යාව සහ බටහිර මනෝ විද්‍යාව යන විෂයයන් ඒකාබද්ධ කොට ක්‍රමවත්ව සැලසුම් කරන ලද "මනෝ විද්‍යාව සහ භාවනාව" නමින් විෂයයක් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

13.

පා.13/'18

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යයනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඬුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

14.

පා. 14/'18

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩසටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

15.

පා. 15/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— පාසල් හා ක්‍රීඩා සමාජ ක්‍රිකට් තරඟාවලිවල තත්ත්වය ඉහළ නැංවීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— පසුගිය වසර කිහිපයක සිටම ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව දැඩි කඩාවැටීමකට ලක් වී ඇති බැවින්, ජාතික කණ්ඩායමට දක්ෂ ක්‍රීඩකයන් සොයා ගැනීම සඳහා පාසල් හා ක්‍රීඩා සමාජ මට්ටමින් ක්‍රිකට් තරඟාවලිවල තත්ත්වය ඉහළ නැංවීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

16.

පා. 16/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල්වල වැඩසිටින වයෝවෘද්ධ භික්ෂූන්වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ බොහෝ ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල් ඉතා අඩු ආර්ථික මට්ටමක පවතින බැවින්, එවැනි පන්සල්වල වැඩසිටින වයෝවෘද්ධ භික්ෂූන්වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

17.

පා. 17/'18

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර නගරය තුළ පිහිටි ජනප්‍රිය පාසල් සඳහා පළමු ශ්‍රේණියේ දරුවන් වෙනුවෙන් නව ගොඩනැගිලි ඉදිකිරීම,— මහනුවර නගරය ආශ්‍රිතව ජනප්‍රිය පාසල් සඳහා පළමුවැනි ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමට විශාල පිරිසක් ඉල්ලුම් කළත්, එම පාසල්වල ඉඩකඩ සීමිත හෙයින්, දරුවන් ඇතුළත් කිරීම ඉතා අසීරු වී ඇති බැවින් මහනුවර නගරය ආශ්‍රිත ප්‍රධාන පාසල්වලට පළමුවැනි ශ්‍රේණියේ පන්ති පැවැත්වීම සඳහා නව ගොඩනැගිලි ඉතා කඩිනමින් ඉදිකර දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

18.

පා.18/'18

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර පල්ලේකැලේ නිදහස් වෙළඳ උද්‍යාන ක්‍රමවත්ව පුළුල් කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය තුළ විරැකියාවෙන් පෙළෙන තරුණ තරුණියන් විශාල පිරිසක් සිටින බැවින්, එම අයට රැකියා අවස්ථා කඩිනමින් සපයා දීම සඳහා මහනුවර පල්ලේකැලේ ප්‍රදේශයේ පිහිටා ඇති නිදහස් වෙළඳ උද්‍යාන දෙක ක්‍රමවත් ලෙස සකසා වැඩි පිරිසකට රැකියා අවස්ථා ලබා ගැනීමට අවස්ථාව සැලසීමට කඩිනමින් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

19.

පා.19/'18

ගරු ලකී ජයවර්ධන මහතා,— උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව යළි ස්ථාපනය කිරීම,— අධිරාජ්‍යවාදී පාලන කාලයේදී අසරණ වූ උඩරට ප්‍රදේශවාසී ජනතාවට සහන සැලසීම උදෙසා ස්ථාපිත කර තිබූ උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව පසුගිය පාලන කාලය තුළ අක්‍රීය තත්ත්වයට පත් කිරීම නිසා උඩරට ජනතාවට සිදුවී ඇති අසාධාරණයන් සාධාරණය කිරීම සඳහා උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව නැවත ක්‍රමවත්ව ස්ථාපිත කරලීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සැලසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

20.

පා.20/'18

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— සියලුම විශ්වවිද්‍යාලවල දැනට පවතින නවක වදය සම්පූර්ණයෙන් නැවැත්වීම සඳහා පවතින නීති ක්‍රියාත්මක කිරීම,— විශ්වවිද්‍යාල තුළ හෝ ඉන් පිටත නවක සිසුන්ට මුහුණ දීමට සිදුවන නවක වදය සම්පූර්ණයෙන්ම වැළැක්වීම හා 1998 අංක 20 දරන අධ්‍යාපන ආයතනවල නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත ප්‍රකාරව, එසේ නවක වදය ක්‍රියාත්මක කරන සියලුම පාර්ශ්වයන්ට නීතිය ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

21.

පා.21/'18

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— අන්තර්ජාලය තුළ අසභ්‍ය වීඩියෝ පට සංසරණය වීම වැළැක්වීමෙහිලා විශේෂ ඒකකයක් පිහිටුවීම,— වර්තමානයේ බහුල වශයෙන් අන්තර්ජාලය ඔස්සේ නොයෙකුත් අසභ්‍ය වීඩියෝ දර්ශන සංසරණය වීම මඟින් පුද්ගලයන්ගේ පුද්ගලිකත්වය විනාශවන අතර විශේෂයෙන්ම, කාන්තා පාර්ශ්වය එමඟින් විශාල අපහසුතාවයකට පත්වන බැවින්, මෙවන් වීඩියෝ දර්ශන ළඟ තබාගෙන සිටින, බෙදා හරින හා නිර්මාණය කරන පුද්ගලයන් පිළිබඳව විමර්ශනය කිරීමට ප්‍රතිඵලදායී විශේෂ ඒකකයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

22.

පා.22/'18

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— විශ්වවිද්‍යාල හා අනෙකුත් සියලුම උසස් අධ්‍යාපන ආයතනවලට විශේෂ පුහුණුවලත් මානසික උපදේශකවරු හෝ අනුශාසකවරු පත්කිරීම,— වර්තමානයේ බහුල වශයෙන් දක්නට ලැබෙන තරුණ තරුණියන්, සිසු සිසුවියන් සියදිවි හානිකර ගැනීමේ ප්‍රවණතාවය මැඩපැවැත්වීම සඳහා සියලුම රජයේ අධ්‍යාපන ආයතන සඳහා පුහුණුවලත් මානසික උපදේශකවරු, අනුශාසකවරු හෝ එම අධ්‍යාපන ආයතනවල දැනට සිටින ගුරුවර ගුරුවරියන්ට මානසික උපදේශනය පිළිබඳ විශේෂ පුහුණුවක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

23.

පා.23/'18

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළ තීරය ආරක්ෂා කර ගැනීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීම,— පුත්තලම දිස්ත්‍රික්කය අතිශය සුන්දර වෙරළ තීරයකට හිමිකම් කීවද, වෙරළ ඛාදනය, කඩොලාන විනාශ වීම, අනවසර ඉදිකිරීම් වැනි හේතු නිසා වෙරළ තීරය දූෂණයට ලක්වී ඇති බැවින්, පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළ තීරය ආරක්ෂා කර ගැනීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

24.

පා.24/'18

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කය සතුව තිබූ වොලිබෝල් ක්‍රීඩාවේ අභිමානය නැවත ගොඩනැගීමට වැඩසටහනක් දියත් කිරීම,— මීට දශකයකට පමණ පෙර පුත්තලම දිස්ත්‍රික්කයේ පාසල් වලින් බිහිවූ දක්ෂ වොලිබෝල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික හා ජාත්‍යන්තර තරඟ වලදී දැක්වූ දක්ෂතා නිසා පුත්තලම දිස්ත්‍රික්කයට වොලිබෝල් ක්‍රීඩාවෙන් ඉතා අභිමානවත් ස්ථානයක් හිමි වුවද, අද වනවිට එම තත්ත්වයේ යම් බිඳ වැටීමක් ඇති බැවින්, නැවත එම අභිමානය පුත්තලම දිස්ත්‍රික්කයට ගෙන ඒමට වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

25.

පා.25/'18

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කය තුළ ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීම,— ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය ප්‍රෝටීන් ලබාදීමටත්, වාර්ෂිකව ටින් මාළු ආනයනය වෙනුවෙන් විදේශ රටවල් කරා ඇදී යන විදේශ විනිමය ආරක්ෂා කර ගැනීම සඳහා මෙන්ම, ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය සියලුම සම්පත් පුත්තලම දිස්ත්‍රික්කය තුළ පවතින බැවින් ද, එම දිස්ත්‍රික්කය තුළ ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

26.

පා.26/'18

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය හලාවත දක්වා දීර්ඝ කිරීම,— රටක සංවර්ධනය සඳහා අධිවේගී මාර්ග ඉතා වැදගත් වන බැවින් ද, වත්මන් යහපාලන රජය යටතේ පුත්තලම දිස්ත්‍රික්කය ඉතා වේගයෙන් සංවර්ධනය වන බැවින් ද, එම සංවර්ධන වේගය තවදුරටත් ඉහළ නැංවීම සඳහා දැනට කොළඹ සිට කටුනායක දක්වා වූ අධිවේගී මාර්ගය හලාවත දක්වා දීර්ඝ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

27.

පා.27/'18

ගරු අශෝක ප්‍රියන්ත මහතා, — වයඹ පළාතේ වැව්, ගංගා සහ ඇළ මාර්ග ආශ්‍රිතව කුඹුක් ශාඛ සිටුවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම,— පසේ පවතින ජලය ආරක්ෂා කිරීමේ හැකියාව මෙන්ම, පාංශු ඛාදනය අවම කිරීමේ ගුණාංග සහිත වූ දිගු ආයු කාලයක් ඇති කුඹුක් ශාඛ, වයඹ පළාතේ වැව්, ගංගා සහ ඇළ මාර්ග ආශ්‍රිතව සිටුවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

28.

පා.28/'18

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— බත්තලංගුණ්ඩුව දූපත්වාසී ධීවර ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා කඩිනම් පියවර ගැනීම,— වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය අර්ධද්වීපය අසල ඇති ප්‍රධාන දූපතක් වන බත්තලංගුණ්ඩුව දූපතේ ධීවර ප්‍රජාවගේ මූලික අවශ්‍යතා පිළිබඳව මෙතෙක් නිසි අවධානයට ලක් නොවී ඇති බැවින්, වත්මන් යහපාලන රජය යටතේ එම ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරා දී ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීම සඳහා කඩිනම් පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

29.

පා.29/'18

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුකුළු ගොවිපළ හිමියන් භාවිතා කරන බැටරි කේජ් ක්‍රමය නවත්වාලීම,— ශ්‍රී ලංකාව අතීතයේ පටන්ම සත්ව කරුණාව පතුරුවාලන බෞද්ධ රටක් වුවද, අද වනවිට සමහර කුකුළු ගොවිපළ හිමියන් භාවිතා කරන බැටරි කේජ් ක්‍රමය නිසා සතුන් දැඩි හිංසාවකට ලක්වීමත්, අධික බිත්තර නිෂ්පාදනය තුළින් සුළු පරිමාණ කුකුළු ගොවිපළ හිමියන්ගේ රැකියා අනතුරුදායක තත්ත්වයකට පත්ව ඇති බැවින්, මෙම අති අමානුෂීය ක්‍රමය නවත්වාලීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

30.

පා.30/'18

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කිරි කර්මාන්තයේ නියුක්ත දේශීය කිරි ගොවීන්ගේ ගැටලු විසඳීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීම,— වාර්ෂිකව අපේ රටට කිරි පිටි ආනයනය සඳහා විශාල මුදලක් වැයවන අතර එම මුදල් අප රට තුළම ඉතිරි කරගත හැකිනම්, එය රටේ ආර්ථිකයට විශාල පිටුබලයක් වන බැවින්, කිරි කර්මාන්තයේ නියුක්ත දේශීය කිරි ගොවීන්ගේ ගැටලු විසඳීමට කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි

31.

පා.31/’18

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාත තුළ පිහිටා ඇති පුරාවිද්‍යා වටිනාකමක් සහිත ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීම,— වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය ඉතා ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන පුරාවිද්‍යා වටිනාකමක් ඇති ස්ථාන රැසක් සහිත දිස්ත්‍රික්කයක් වන අතර අතීතයේදී කුරුණෑගල, දඹදෙණිය සහ යාපහුව වැනි රාජධානි පිහිටා තිබුනේද කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ වුවත්, අද වනවිට එම පෞරාණික ස්ථානවල ආරක්ෂාව සම්බන්ධයෙන් බලවත් ගැටලු මතුවී ඇති බැවින්, එම පුරාවිද්‍යා ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

32.

පා.32/’18

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුළුල් සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කිරීම,— ඕනෑම රටක සාර්ථක සමාජ ආරක්ෂණ ජාලයක් පැවතීම එම රටේ ජීවත් වන පුරවැසියන්ට වැදගත් වන අතර ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හෝ අර්ථ සාධක ක්‍රමයක් ක්‍රියාත්මක වුවද, රටේ අවිධිමත් අංශයේ සේවකයන් සඳහා කිසිදු සමාජ ආරක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක නොවන බැවින්, සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුළුල් සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.